# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ මහා නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොළඹ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**(අ)** මහා නගර සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**(ආ)** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.6 ඡේදයේ 1.6.1(ii) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ප්‍රමිතියේ 10.1 වන ඡේදය ප්‍රකාරව ඉඩම් විකිණීමේ ආදායම හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය සේ හඳුනාගත නොහැකි වුවද විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල රු 433,890,613. ක් වූ ඉඩම් විකිණීමේ ආදායම් හුවමාරු ගණුදෙනුවලින් වන අයභාරය ලෙස ගිණුම්ගත කිරිම නිසා 2021 දිනට සභාවේ 31 දෙසැම්බර් අතිරික්තය රු 433,890,613.කින් වැඩියෙන් දක්වා තිබුණි. | සභාව සතුව පවතින ඉඩම් තක්සේරුකර පිරිවැය මූල්‍ය ප්‍රකාශන වල මෙතෙක් දක්වා නොමැති බැවින් ඉඩම් විකිණීමෙන් ලද ආදායම තුළින් උපයන ප්‍රාග්ධන ලාභය ගණනය කිරිම අපහසුය. නිසි ක්‍රමවේදයක් ඉදිරියේදී ගන්නා බව දන්වා ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කිරිම. |
| **(ii)** | ප්‍රමිතියේ 4.11 ඡේදය ප්‍රකාරව පූර්ව කාල පරිච්ඡේදවලට සම්බන්ධිත වැරදි වලට අදාල වටිනාකම රු.2,234,233,420 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල හඳුනාගෙන තිබුණි. නමුත් උක්ත ප්‍රමිතියේ 4.14 (අ) ඡේදය ප්‍රකාරව පූර්ව කාල පරිච්ඡේදයේ වරදෙහි ස්වභාවය අස්තිත්වයක් විසින් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය ප්‍රකාශන තුල හෙලිදරව් කර නොතිබුණි. තවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය තුලද පූර්ව කාල පරිච්ඡේදවලට සම්බන්ධිත වැරදි වටිනාකම රු.2,234,233,420 අතිරික්තය සහ ඌනතා ගිණුමේ ගැලපීම් ලෙස දක්වා එකතු කර තිබුණි. එම වටිනාකම ගණනය කළ ආකාරය සහ ගණුදෙනුවල ස්වභාවය පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.2,234,233,420 ක් මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයට එකතු කර දැක්වීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | සභාවේ අංශ 65ක් හරහා කරන වැරදි නිවැරදි කිරිම් අන්තර්ගත වන අතර සංඛ්‍යාත්මකව විශාල අගයක් ගන්නා බැවින් එක් එක් වැරදි නිවැරදි කිරිම සඳහා වෙන වෙනම හේතු දැක්වීම අසීරු බව දන්වා ඇත. | පළාත් පාලනය සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 4.14 ඡේදයට අනුගත වීම සඳහා එක් එක් අංශ හරහා සුදුසු වැඩ පිළිවෙලක් යොදා ගැනීමට සභාවේ නිළධාරින් විසින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | සමාලෝචිත වර්ෂය තුලදී මාර්ග පුනුරුත්ථාපනය සඳහා රජයෙන් හැර වෙනත් පාර්ශවයන්ගෙන් ලද රු.35,257,077 ක් වූ ප්‍රාග්ධන වියදමක් පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 9.14 වගන්තිය ප්‍රකාරව වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත යුතු වුවත් එසේ හඳුනා නොගෙන පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් යටතේ අයභාරයක් ලෙස හඳුනාගෙන තිබුණි. එම නිසා රු.35,257,077 ක වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වැඩි වී තිබුණි. | මාර්ගවල සිදුවන පුනරුත්ථාපන කටයුතු වලට වියදම් දැරීම සඳහා පළාත් පාලන ආයතන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 9.10 ප්‍රකාරව පැවරුම් වියදම් කාල පරිච්ඡේදයේ අයභාරය ලෙස හඳුනාගත හැකිය. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 9.14 හි සඳහන් පරිදි වෙනත් විස්තීරණ ආදායම් හඳුනාගත යුතු වේ. |
| **(iv)** | ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයෙහි සඳහන් පරිදි දේපළ, පිරියත හා උපකරණ ක්ෂය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට සභාවේ මූල්‍ය ප්‍රකාශනය තුල දේපළ පිරියත හා උපකරණ ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | ක්ෂය කිරිම් හා ක්‍රමක්ෂය කිරිම් 2023 වර්ෂයේ සිට කරන බව දන්වා ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කිරිම. |
| **(v)** | ප්‍රමිත අංක 6.1 වගන්තිය ප්‍රකාරව යටිතල පහසුකම් සපයන වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතු වුවත් එකතුව රු.591,888,944 ක් වූ යටිතල පහසුකම් සපයන වත්කම් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත නොකර ආදායම් ප්‍රකාශය තුල වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අතිරික්තය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි. | අංශ 65 සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සභාවේ යටිතල පහසුකම් ප්‍රාග්ධනිත කිරිමේදී ඇතිවන ගැටළු මත යටිතල පහසුකම් ප්‍රාග්ධනිත ගත කර නොමැති අතර ඉදිරි ක්‍රමවේදයක් සැකසීමට සටහන් කරගත් බව දන්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත වෙමින් යටිතල පහසුකම් ප්‍රාග්ධනිත කිරිමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරිම. |
| **(vi)** | ප්‍රමිත අංක 6.10 වන වගන්තිය ප්‍රකාරව අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය තුල ක්‍රමක්ෂය ගිණුම්ගත කර නොතිබුණි. | ක්‍රමක්ෂය සඳහා වූ සභාවේ අනුගමනය කරන ප්‍රමිතියේ මූල්‍ය ප්‍රකාශනවල, 2.1 යටතේද, ඒ සඳහා වූ සභාවේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල 3.3 යටතේද සඳහන් කර ඇත. | ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරිම සිදුකළ යුතු අතර අස්පෘශ්‍ය වත්කම් ගිණුම් වෙනම හඳුනාගැනීම කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අවස්ථා 73 කදී එකතුව රු.1,478,292,803 ක වටිනාකමකට ප්‍රවර්තන වර්ෂයේදී ණයගිමියන් ලෙස හඳුනාගනිමින් ගිණුම් තැබීම සිදුකර ප්‍රවර්තන වර්ෂය තුලදීම එම හඳුනාගැනීම නිවැරදි නොවන බව අනාවරණය වීම හේතුවෙන් එම අගය ණයගිමියන්ගෙන් ඉවත් කිරිමට කටයුතු කර තිබුණද ඊට අනුරූපී ගිණුම් නිවැරදි නොකිරිම හේතුවෙන් වියදම් රු.670,046,799 කින්ද ස්ථාවර වත්කම් රු.808,246,005 කින්ද වැඩියෙන් දක්වා තිබුණි. | පද්ධති දෝෂයක් මත හටගත් ගැටළුකාරී තත්ත්වයකි. | පද්ධති දෝෂ හඳුනාගෙන නිවැරදි කිරිම. |
| (ii) | ආදායම් අංශයේ වාර්තා අනුව වෙළඳ බලපත්‍ර ආදායම රු.13,121,016 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.22,690,076 ක් ලෙස ගිණුම්ගත කිරිම නිසා වර්ෂයේ ආදායම රු.9,569,060 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ වටිනාකමට පෙර වර්ෂ වල ආදායමද ඇතුලත් කර ඇත. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 2.5 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කළ යුතුය. |
| (iii) | අනුග්‍රහක ව්‍යාපෘති යටතේ 2021 වර්ෂය වෙනුවෙන් ලැබි තිබූ රු.29,143,853 ක භුවමාරු ගණුදෙනු වලින් වන අයභාරය සටහන් අංක 7 යටතේ හඳුනාගත යුතු වුවත් පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් සටහන් අංක 05 යටතේ හඳුනාගෙන තිබුණි. | නිවැරදි කිරිම් සිදු කිරිමට එකඟ වී ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කිරිම. |

## 1.6.3 නොසැසඳු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (i) | ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් හා ඊට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.398,584,987 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එකී වෙනස්කම්වලට හේතු ඉදිරිපත් නොකෙරුණි. | 167-1-001-6-3169430 ගිණුමට අදාල වෙනස 2022 ජනවාරි මස නිවැරදි කර ඇත. අනෙකුත් වියදම් වලට අදාල පොත් පරික්ෂා කරමින් පවතින අතර කඩිනමින් නිරවුල් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දැනුම් දී ඇත. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදීම හඳුනාගෙන නිවැරදි කිරිම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව ගබඩා ණයහිමි වටිනාකම රු.427,183,784 ක් වුවත් මුල්‍ය ප්‍රකාශනයේ එය රු.200,908,100 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ගබඩා ණයහිමියන් රු.226,275,683 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | රු.427,183,764 ක ගබඩා ණයහිමි ශේෂය නිවැරදි නොවන අතර උපලේඛන 1.4.1.1 හි දැක්වෙන ණයහිමි උපලේඛනයේ දැක්වෙන රු.200,960,100 නිවැරදි වේ. | පරිගණක පද්ධතිය තුලින් ලබා ගන්නා උපලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීම. |
| **(iii)** | දැන්වීම් ප්‍රචාරණ කමිටුවේ වාර්තා අනුව දැන්වීම් පුවරු ආදායම 14,466,579 ක් වුවද මුල්‍ය ප්‍රකාශන අනුව එය රු.17,931,848 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම රු.3,465,269 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට දැන්විම් පුවරු ආදායම රු.17,931,848 නිවැරදි වන අතර ඊට අදාලව දැන්වීම් කමිටුව පවත්වා ගනු ලබන උපලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබයි. | තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම. |
| **(iv)** | වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ සටහන් අංක 18 යටතේ මෝටර් රථ වටිනාකම රු.3,602,043,339 ක් ලෙස දක්වා තිබූ අතර මෝටර් රථ ලේඛනය අනුව වටිනාකම රු.4,257,355,321 ක් විය. ඒ අනුව රු.655,311,982 ක් අඩුවෙන් මෝටර් රථ වටිනාකම මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පරික්ෂා කර කඩිනමින් නිවැරදි කිරීමට සටහන් කර ගත් බව දන්වා ඇත. | මෝටර් රථ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීම. |
| **(v)** | සභාව පරිගණක මෘදුකාංග පද්ධතියක් හරහා දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම පද්ධතිය මගින් ලබා ගන්නා ලද සාරාංශ වාර්තාව අනුව මුළු දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.7,240,344,597 ක් වුවද මුල්‍ය ප්‍රකාශනය අනුව දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.20,980,036,850 ක් වූ බැවින් රු.13,739,692,253 ක වෙනසක් නිරික්ෂණය විය. | ඉදිරියේදී වැරදි නිවැරදි කර ගන්නා බව සටහන් කර ඇත. | පරිගණක පද්ධතිය කඩිනමින් යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම. |

## 1.7 අනුකූල නොවීම

## 1.7.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති රීති, රෙගුලාසි | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි හා 2020 දිනැති රාජ්‍ය 28 අගෝස්තු මුදල් චක්‍රලේඛ අංක 2020/01** | | | |
| (i) | මු.රෙ.396(ඇ) | වටිනාකම රු.37,516,845 ක් වු නිකුත් කරන ලද නමුත් මාස ක කාලය තුළදි 06 ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් 550 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරිමට කටයුතු කරමින් පවති | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිම. |
| (ආ) | 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | නාගරික සංවර්ධන අධිකාරිය නමින්ම ඉතිරිකිරිමේ ගිණුම් බැංකු ගිණුම ආරම්භ කිරිමේ අරමුණුවලින් බැහැරව සහ නාගරික සංවර්ධන අධිකාරියේ පුර්ව අනුමැතියකින් තොරව ගිණුමේ තැන්පත් වන මුදල් වලින් රු.721,010,150 ක මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර එම ස්ථාවර තැන්පතු ඇපයට තබා බැංකු අයිරා ලබාගෙන තිබුණි. | රට තුල පැවති අර්බුධකාරී තත්ත්වය මත කොළඹ මහා නගර සභාව දැඩි මුල්‍ය අර්බුධයකට මුහුණ දුන් බැවින් සභාවේ වියදම් පියවා ගැනීම සඳහා අනුමත බැංකු අයිරා සීමාව ඉහළ නංවා ගැනීමේ අරමුණින් මෙම ස්ථාවර තැන්පත් ආයෝජන ඒ වෙනුවෙන් ඇපයට තැබු බව කාරුණිකව පෙන්වා දෙන අතර සංවර්ධන ව්‍යාපෘති යෝජනා ලද විගස අනුමත අයිරා | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරිම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සීමාව සංශෝධනය කර ගෙන ඒම ස්ථාවර තැන්පත් ආයෝජන මුදල් ලබා ගෙන එම ව්‍යාපෘති වෙනුවෙන් ඵලදායී ලෙස ආයෝජනය කිරිමට සභාවට හැකියාව පවතින බව දැනුම් දී ඇත. | |
| **(ඇ)** | 1989 මාර්තු 10 දිනැති අංක 10 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | අභ්‍යන්තර ඉදිකිරීම් අතිරික්ත , දේශ අනුපාතය හා වාහන බිම් ප්‍ර ඉඩකඩ ගාල් කිරිමට නියමිත නොමැති වීමසම්බන්ධයෙන් සංවර්ධකයන්ගෙන් අයකර ගනු ලබන මුදලින් සියයට ක් 25 නාගරික සංවර්ධන අධිකාරිය වෙත මාසිකව බැර කළ යුතු වුවත් ගිණුම ආරම්භයේ සිටම ඒ අනුවකටයුතු කර නොතිබු බව නිරික්ෂණය විය. | එම නිසා මෙම මුදල් වලට කොළඹ මහා නගර සභාවට අවශ්‍ය කරන පිරිවැයෙන් මුදලක් ගොඩනැගිලි අනුමත කිරිමේදී අනවසර ඉදි කිරීම්, අතිරේක ඉඩබිම් ප්‍රදේශ අනුපාත, වාහන ගාල් කිරිමට නියමිත ඉඩ නොමැති අවස්ථා වල අයකර ගන්නා ලද දඩ මුදල් තිබෙන ගිණුමෙන් කොටසක් ලබා ගැනීම සිදු කරනු ලබයි. එකි චක්‍රලේඛ අංක 5/1/50 හා 1989.03.13 දිනැති චක්‍රලේඛය අනුව එම ගිණුමෙන් සියයට 25 නාගරික සංවර්ධන අධිකාරියට යොමු කිරිමේ අරමුණ එම මුදල් නැවත කොළඹ නගරයේ සංවර්ධනයට යොදා ගැනීම නිසා එම මුදල් කොළඹ නගරයේ සංවර්ධනයට | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරිම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කොළඹ මහා නගර සභාව විසින් සෘජුවම යොදා ගන්නා බව දන්වා සිටිමි. | |
| **(ඈ)** | 1993 නොවැම්බර් 18 දිනැති අංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛයේ 4 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානයට පටහැනි ලෙස මෙම ගිණුමට එකතු වූ රු.782,249,685 ක් වූ මුදල් අරමුණුගත කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | විශේෂ රාජ්‍ය නියෝජිත ගිණුමට අදාල බැංකු ගිණුමෙහි සඳහන් ශේෂයට සමාන ශේෂයක් අදාල වගකීම් ගිණුමෙහි ද පැවති අතර ජංගම ගිණුමක පොලි රහිතව අරමුදල් රඳවා තැබීම ඵලදායී මූල්‍ය කළමනාකරණයක නොවන නිසා එම මුදල් වලින් කොටසක් වැඩි පොලී ප්‍රතිශතයක් යටතේ ස්ථාවර ගිණුම්වල ආයෝජනය කළ අතර එම ස්ථාවර තැන්පත් ගිණුම් වල ආයෝජනය කර ඇත. එසේම 167100183169429 බැංකු ගිණුමෙහි පවතින ඉතිරි අරමුදල් යම් සංවර්ධන ව්‍යාපෘතියක් ලදහොත් ඒ වෙනුවෙන් භාවිතා කිරිමේ අපේක්ෂාවෙන් පවත්වාගෙන යන අතර එවැනි සංවර්ධන ව්‍යාපෘති යෝජනාවක් මේ දක්වා නොලද හෙයින් එම අරමුදල් සඳහා උපයෝජනාවක් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරිම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සිදුවී නොමැති බව සඳහන් කර ඇත. | |
| **(ඉ)** | 2020 අගෝස්තු 27 දිනැති අංක LGD/09/2019(1) දරන පළාත් පාලන ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛය | වාර්ෂික මහා සභාව වෙත ඉදිරිපත් කර තිබූ අයවැය 2021 ,ලේඛනය චක්‍රලේඛය මඟින් උපලේඛනගත කර තිබූ ආකෘති පත්‍ර ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබූ අතර වාර්ෂික අයවැය ලේඛනය නව ගිණුම් ප්‍රමිතියට සමගාමීව මෙම චක්‍රලේඛය මඟින් නියම කර ඇති කේත අංක හා ආකෘති පත්‍ර භාවිතා කරමින් පිළියෙල කර නොතිබුණි. | 2023 අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීමේදී ඒ අනුව කටයුතු කරන බන දැනුම් දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම. |
| **(ඊ)** | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | | | |
| | (i) 13.2 වගන්තිය | පිරිවැය රු.165,860,240 ක් වූ පාවිච්චි කළ නොහැකි වාහන 84 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට වාහන සියල්ල සඳහා චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කර වෙන්දේසි කර විකිණීම සඳහා නාගරික කොමසාරිස් අනුමැතියට ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| | (ii) 11.1 වගන්තිය | චක්‍රලේඛයේ විධිවිධාන සහ මුදල් රෙගුලාසි 756(6) අනුව<br>• භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීම 2022 ජුනි 15ට පෙර සිදු කළ යුතු වුවත් 2022 ජුනි 30 දිනය වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.<br>ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම 2022 අප්‍රේල් 30ට පෙර අවසන් කළ යුතු වුවත් 2022 ජුනි 30 දිනය වන විටත් එම කටයුතු නිම කර නොතිබුණි. | මු.රෙ 756(6) අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු සිදු කරමින් පවතින අතර නියමිත දිනට නිම කිරීමට නොහැකි වූයේ රටේ පැවති තත්ත්වය හේතුවෙන් නිළධාරීන් සේවයට කැඳවීම සීමිත වූ බැවින් සහ සභාව සතු දේපළ පිරියත වල ප්‍රමාණයද විශාල වූ බැවිනි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. |

**1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම.**

---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වර්ෂ 2016 සිට 2019 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එවන ලද බදු වාර්තා අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කල අගය මත බදු රු.627,440,441 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිගණක තොරතුරු පද්ධතිය අවශ්‍ය ලෙස සකස් කර ගැනීමට නොහැකි වීම නිසා 2016-2019 තොරතුරු ඉදිරිපත් කිරිමට නොහැකි වී ඇත. ඉදිරියේදී ආදායම් බදු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර විසඳුම් ගැනීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් බදු වාර්තා කාලීනව ඉදිරිපත් කිරිම සහ ගෙවිය යුතු හිඟ බදු කඩිනමින් ගෙවා නිරවුල් කිරිමට කටයුතු කිරිම. |

**2. මූල්‍ය සමාලෝචනය**

-------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.570,693,595 ක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.366,815,280 ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

-----------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ආදායම් රැස්කිරිමේ ගිණුම් වලට අදාලව ශේෂය ඍණ අගයක් විය නොහැකි වුවත් අංක 236-1-001-9-3478543 දරන ගිණුමට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ රු.5,611,732 ක ඍණ ශේෂයක් ලෙස දක්වා තිබුණි. | 2016 පරිගණක පද්ධතිය තුල ඇති වූ ගැටළුවක් නිසා ඍණ ශේෂයක් ලෙස දක්වා ඇති බවත් ඉදිරියේදී නිවැරදි කිරිමට පියවර ගන්නා බව දන්වා ඇත. | කඩිනමින් නිවැරදි කිරිමට කටයුතු කිරිම. |

**2.3 ආදායම් පරිපාලනය**

--------------------------

**2.3.1 ආදායම් රැස්කිරිමේ කාර්ය සාධනය**

---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>----------<br>2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ වරිපනම් ප්‍රමාණය රු.4,202,014,333 විය. එම මුළු හිඟ වරිපනම් ශේෂ අතුරින් රුපියල් ලක්ෂ පහ ඉක්මවූ දේපල 1121 ක් වූ අතර එහි හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු.1,893,978,890 ක් විය. එසේම මෙම හිඟ දේපළ අතුරින් දේපළ 166 ක් රජයේ දේපළ වන අතර එහි හිඟය රු.504,395,533 විය. මෙම දේපල අතුරින් දේපල ඒකක 812 ක් 2021 වර්ෂයේ කිසිදු හිඟ මුදලක් ගෙවා නොතිබුණි. රුපියල් මිලියන 10 ඉක්මවූ හිඟ වරිපනම් බදු දේපල සංඛ්‍යාව 24 ක් වූ අතර එහි වටිනාකම රු.445,568,243 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කිරිම. |

**(ආ) පදික කඩකුලි**

**------------------**

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු පදික කඩකුලි ආදායම රු.602,373,386 ක් වු අතර එම වටිනාකම වර්ෂයේ බිල් කිරිම මෙන් සියයට 647 පමණ විය.මෙම හිඟ වටිනාකම තුල රු.163,207,567 ක් වු අක්‍රිය පදික කඩකුලියක්ද අන්තර්ගතව තිබු අතර මෙම ප්‍රමාණය අයකර ගැනීමට හෝ ලියා හැරිමට කටයුතු කර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කිරිම. |

**(ඇ) නිවාස කුලී**

**-------------**

| | | |
|---|---|---|
| එක් එක් නිවාස සංකීර්ණ වලින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ නිවාස කුලිය රු.21,298,843 ක් විය. | හිඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවති. | කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කිරිම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**------------------------------**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**---------------------------------------**

| | විගණන නිරික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.481,617,786 ක වටිනාකමකට ඉදිකර 2021 නොවැම්බර් 30 දින කොළඹ මහා නගර සභාවට භාරදී තිබු කොම්පඤ්ඤවිදිය අපජල පොම්පාගාරය අක්‍රිය තත්ත්වයේ පවතින බව නිරික්ෂණය විය. පොම්පාගාරය භාර ගැනීමෙන් පසු සිදු කරන ලද මුලික පරික්ෂාවේදී පොම්පාගාරය හා සම්බන්ධ අධිපීඩන නල පද්ධතියට හානි සිදු වීම මෙයට හේතු වී තිබුණි. එමෙන්ම කොම්පඤ්ඤවීදිය අපජල පොම්පාගාරය වෙත එකතුවන අපජලය විවෘත කාණුවක් හරහා බෙරේ වැවට මුදා හැරීම තුලින් විශාල පරිසර හානියක්ද සිදුවන බව නිරික්ෂණය විය. | මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය මඟින් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා ලබාදීමට එකඟ වී තිබු නමුත් අරමුදල් ලබාදීම දිගින් දිගටම ප්‍රමාද වී ඇත.නල පද්ධතියේ ආපදාවන්ට ලක්වු කොටස් අළුත්වැඩියා කර පොම්පාගාරය ක්‍රියාකිරිමට කටයුතු යොදවමින් පවතින බව දන්වමි. | අධිපීඩන නල පද්ධතිය කඩිනමින් අළුත්වැඩියා කර පොම්පාගාරය ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රථගාල් ගාස්තු අය කිරිම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පෞද්ගලික ආයතන විසින් නගර සභාවට ගෙවිය යුතු මාසික කුලී මුදල් ගෙවීම දිගින් දිගටම පැහැරහැර තිබූ අතර දිනට 31 දෙසැම්බර් 2021 කින් අයකර ගත යුතු හිඟ 38 ආයතන ගාස්තු ආදායමරු 265,499,052.ක් විය. | පිළිතුරු ලබාදී නොමැත | කාල ප්‍රමාදයකින් තොරව හිඟ ගාස්තු අයකර ගැනීමට ක්‍රියා කිරිම. |
| (ඇ) | තෝරාගත් බල ප්‍රදේශයක පාර්කින් මීටර් සවිකිරිම මඟින් රථවාහන ගාල් කිරිම සඳහා පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට අදාල ආයතනයෙන් අයකර ගත යුතු හිඟ කුලී ආදායම රු.101,771,107 ක් විය. 2016 වර්ෂයේ සිටම නිසි පරිදි කුලී මුදල් නොගෙවීම නිසා 2021 අප්‍රේල් 07 දින අදාල ආයතනය සමඟ පැවති ගිවිසුම අත්හිටුවීමට නගර සභාව කටයුතු කර තිබූ නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් එම ප්‍රදේශවල රථගාල් ගාස්තු අයකර ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් සකසා නොතිබුණි. මේ අනුව වසරකට ආසන්න කාලයක් සඳහා නගර සභාවට රු.66,724,488 ක පමණ ආදායමක් අහිමි වී ඇති බව නිරික්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත | කාල ප්‍රමාදයකින් තොරව හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කිරිම. |

**3.2 ව්‍යාපෘති වැඩ ප්‍රමාදයන්**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු සංවර්ධන බැංකු ණය අංක 3348/3349 යටතේ අපජල පවිත්‍රාගාරය ඉදිකිරිමේ කාර්යය සඳහා වැල්ලවත්තේ රුද්‍රා ක්‍රීඩාංගණය ලබාදීමට 2009 සැප්තැම්බර් 28 දින අංක 543 දරන තීරණය මඟින් කොළඹ මහා නගර සභාවේ බලතල කාර්යයන් හා කර්තව්‍යන් ඉටු කිරිමේ බලධාරි, ප්‍රධාන නගර පරිපාලක විසින් අනුමැතිය ලබාදී තිබුණි. මේ අනුව රු.4,360,779,986 ක වැට් රහිත වටිනාකමට අපජල පවිත්‍රාගාරය ඉදිකිරිම සඳහා සැලසුම් කිරිම, ඉදිකිරිම හා මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම පදනමට 2021 ඔක්තෝම්බර් 11 දින ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට එළඹ තිබුණි. 2021 මාර්තු | මෙම ප්‍රමාදයන් හේතුවෙන් අමතර පිරිවැයක් දැරිමට සිදු වී ඇති බව පිළිගන්නා අතර මෙම කාර්යයේදී ව්‍යාපෘති කාර්යාලය හා ඊට අදාල ආයතන මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග ගනු ලැබුවද බාහිර ආයතන සමග කටයුතු කිරිමේදී සිදුවන ප්‍රමාදයන් මේ සඳහා බලපා ඇත. | ප්‍රතිපත්ති සහයක කණ්ඩායම් වල නිළධාරින්, ව්‍යාපෘති නිළධාරින් වගකිව යුතු නිළධාරීන් කාර්යක්ෂමව කටයුතු කර ගැටළු නිරාකරණය කර ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | 18 දින ඉඩම කොන්ත්‍රාත්කරු වෙත ලබාදිය යුතු වුවද 2022 මාර්තු 31 දින වන විටත් ඉඩම ලබාදීමට කටයුතු කර නොතිබුණි. මේ නිසා කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරිමේ සැලැස්ම අනුව 2021 දෙසැම්බර් 31 දිනට නිම විය යුතු කාර්යයන් ඉටු කිරිමට නොහැකි වී තිබුණි. යෝජිත ඉඩම කොන්ත්‍රාත්කරු වෙත භාරදීම ප්‍රමාදවීම මත කොන්ත්‍රාත්කරුගේ අතිරේක පිරිවැය මත කරනු ලබන හිමිකම්පෑම් හේතුවෙන් විශාල මුදලක් ව්‍යාපෘතියේ අරමුණුවලින් පරිබාහිර කටයුතු වෙනුවෙන් වැය කිරිමට සිදුවීමේ දැඩි අවධානමක් පවතින අතර ව්‍යාපෘති ප්‍රමාදවීම මත පිරිවැය ඉහළයාම සහ මුදල් ප්‍රමාණවත් නොවීම සහ ව්‍යාපෘති කාලය අවසන් වීම මත ව්‍යාපෘතිය අතහැර දැමීමට සිදුවීමේ අවධානමක්ද පවතින බව නිරික්ෂණය විය. එමෙන්ම රු.මි 30,229 පමණ වැය වන සමස්ත අපජල ව්‍යාපෘතිය සඳහා ඉදිකරනු ලබන එකම අපජල පවිත්‍රාගාරය මෙම ව්‍යාපෘතිය වන බැවින් මෙය අසාර්ථක වීම තුලින් සමස්ත ව්‍යාපෘතිය අසාර්ථකවීමේ අවධානමක්ද පවතින බව නිරික්ෂණය විය. | | |
| (ආ) | ආසියානු බැංකු ණය අංක 3348/3349 යටතේ පිරිවැය රු.717,054,675 ක තලකොටුව පොම්ප මධ්‍යස්ථානය ඉදිකිරිම සඳහා වූ යෝජිත ඉඩම කොන්ත්‍රාත්කරුට භාරදීම ප්‍රමාද වීම මත කොන්ත්‍රාත්කරුට දැරීමට සිදු වූ අතිරේක පිරිවැය වෙනුවෙන් රු.3,071,262,126 ක හිමිකම් පෑමක් සිදුකර තිබූ අතර කොන්ත්‍රාත් ඉංජිනේරු එයට එකඟ නොවීම මත ආරවුල් මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. ආරවුල් මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් පසු කොන්ත්‍රාත්කරු රු.1,050,015,153 ක හිමිකම් පෑමක් සිදුකර තිබූ අතර කොන්ත්‍රාත් ඉංජිනේරුවරයා ඉදිරිපත් කර ඇති ප්‍රමාද ගාස්තු ගෙවීම රු.261,286,732 ක් විය. මේ අනුව ආරවුල විසඳී නොමැති නිසා බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා යොමු කර තිබුණි.ව්‍යාපෘති කාර්යයන් නිසි ලෙස කළමනාකරණය කර නොගැනීම | මෙම ප්‍රමාදයන් හේතුවෙන් අමතර පිරිවැයක් දැරීමට සිදු වී ඇති බව පිළිගන්නා අතර මෙම කාර්යයේදී ව්‍යාපෘති කාර්යාලය හා ඊට අදාල ආයතන මට්ටමින් ගත හැකි ක්‍රියාමාර්ග ගනු ලැබුවද බාහිර ආයතන සමග කටයුතු කිරිමේදී සිදුවන ප්‍රමාදයන් මේ සඳහා බලපා ඇත. | ප්‍රතිපත්ති සහයක කණ්ඩායම් වල නිළධාරින්, ව්‍යාපෘති නිළධාරින් වගකිව යුතු නිළධාරීන් කාර්යක්ෂමව කටයුතු කර ගැටළු නිරාකරණය කර ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

නිසා විදේශ ණය ව්‍යාපෘති යටතේ ලබාගන්නා මුදල් කාර්යක්ෂමව ව්‍යාපෘති කාර්යයන් සඳහා යොදවා ගැනීමට නොහැකි වීමේ අවදානමක් පවතින බව නිරික්ෂණය විය.

(ඈ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී පැන නගින ගැටළු කඩිනමින් විසඳිම සඳහා කොළඹ මහා නගර සභාවේ නිළධාරීන්, පළාත් පාලන අමාත්‍යංශයේ නිළධාරීන් සහ බස්නාහිර පළාත් සභාවේ නිළධාරීන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමත් 2010 වර්ෂයේ සිට පත්කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එම නිළධාරීන් සඳහා රු.41,236,786 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. නමුත් ආසියානු සංවර්ධන අපජල කළමනාකරණ සමස්ථ ව්‍යාපෘතියම 2021 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමීව ක්‍රියාත්මක වන ව්‍යාපෘතින් බවට පත් වී තිබුුණි. විස්තර පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| **i.** ණය ගිවිසුම් අංක 2558/2557 12,597.11 මිලියන.යටතේ වු රු පිරිවැය වු මහ කොළඹ අපජල 2010 පෘතියකළමනාකරණ ව්‍යා 2015 දින ආරම්භ කර 04 ල්අප්‍රේ දින අවසන් කිරිමට 30 ජුනි පෘතිය නමුත් ව්‍යා නියමිතව තිබු දෙසැම්බර් 2022 අවසන්විමේ දිනය න් 90 දින දක්වා එනම් මාස 31 මාද වප්‍රු තිබුණි . | ලංසු ඇගයීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම, විදේශිය සමාගම් යොදවා ගැනීමට සිදුවීම පැරණි මලාපවහන පද්ධතියක් බැවින් තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව,කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා වැනි කරුණු නිසා ප්‍රමාද වී ඇත. | හිඟ විදේශ ආයෝජන තුළින් උපරිම ප්‍රයෝජන ගැනීමට ක්‍රියාකිරිම, නිළධාරින් සක්‍රිය ලෙස දායක වු බව මැනිම සඳහා ක්‍රමවේද සැකසීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරිම. |
| **ii.** ණය ගිවිසුම් අංක 3349/ 3348 16,401.76 යනමිලි.යටතේ වු රු 2016 පිරිවැය වු වැඩසටහන දින 31 නොවැම්බර්අවසන් කළ යුතුව තිබුණත් සැලසුම් කල කාර්යයන් නිම කිරිමට නොහැකි වීම මත දින 24 ඔක්තෝබර් 2022 .දක්වා කාලය දීර්ඝ කර තිබුණි | ලංසු ඇගයීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම, විදේශිය සමාගම් යොදවා ගැනීමට සිදුවීම පැරණි මලාපවහන පද්ධතියක් බැවින් තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව,කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා වැනි කරුණු නිසා ප්‍රමාද වී ඇත. | හිඟ විදේශ ආයෝජන තුළින් උපරිම ප්‍රයෝජන ගැනීමට ක්‍රියාකිරිම, නිළධාරින් සක්‍රිය ලෙස දායක වු බව මැනිම සඳහා ක්‍රමවේද සැකසීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරිම. |
| **iii.** ණය ගිවිසුම් අංක ය 3030ටතේ වු රුපිරිවැය වු 1,230.60 මිලියන. ආරම්භ 03 ජුනි 2014 වැඩසටහන | ලංසු ඇගයීම ප්‍රමාද වීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාදවීම, විදේශිය සමාගම් යොදවා | හිඟ විදේශ ආයෝජන තුළින් උපරිම ප්‍රයෝජන ගැනීමට ක්රියාකිරිම, |

| | | | |
|---|---|---|---|
| | අවසන් කළ යුතුව 30 ජුනි 2019 කර තිබුණත් සැලසුම් කල කාර්යයන් නිම කිරිමට නොහැකි වීම මත දින දක්වා 24 ඔක්තෝබර් 2022 .කාලය දීර්ඝ කර තිබුණි. | ගැනීමට සිදුවීම පැරණි මලාපවහන පද්ධතියක් බැවින් තොරතුරු ලබා ගැනීමේ අපහසුතාව,කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා වැනි කරුණු නිසා ප්‍රමාද වී ඇත. | නිළධාරින් සක්‍රිය ලෙස දායක වූ බව මැනිම සඳහා ක්‍රමවේද සැකසීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරිම. |
| (ඇ) | ණය අංක 2557/2558 සහ ණය අංක 3348 /3349 අදාලව 2021 දෙසැම්බර් 31 දිනට විවිධ හේතුන් මත ආරවුල් මණ්ඩලයට හා බේරුම්කරණය සඳහා රු.7,268,516,296 වටිනා සිද්ධින් 07 යොමුකර තිබුණි. මෙම වටිනාකම සමස්ත ව්‍යාපෘති වටිනාකමින් සියයට 24 පමණ වන අතර මෙම තත්ත්වය ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වලතාවයක් බව නිරික්ෂණය විය. මේ අනුව ව්‍යාපෘතිය අසාර්ථකවීමේ දැඩි අවධානමක් පවතින අතර අපේක්ෂිත ව්‍යාපෘති කාර්යයන් අවසන් කර ගැනීමට නොහැකි වීම මත ව්‍යාපෘති අසාර්ථක වීමේ අවධානමක් පවතින බවත් නිරික්ෂණය විය. | කොන්ත්‍රාත්කරුවකු විසින් කොන්ත්‍රාත් හිමිකම්පෑම සෑම විටම දුර්වල කොන්ත්‍රාත් කළමනාකරණය නිසා සිදුවන බව අදහස් නොවන බව දන්වා ඇත. | ප්‍රතිපත්ති සහයක කණ්ඩායම් වල නිළධාරින්, ව්‍යාපෘති නිළධාරින් වගකිව යුතු නිළධාරීන් කාර්යක්ෂමව කටයුතු කර ගැටළු නිරාකරණය කර ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඉ) | වර්ෂ 2013 සිට වර්ෂ 2021 දක්වා වූ කාල සීමාවන්ට අදාලව ජලාපවහන අංශය විසින් ප්‍රදානය කරන ලද රු.1,075,286,017 ක් වූ ව්‍යාපෘති 19 ක කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබුණද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඒවායේ වැඩ නිම කර නොතිබුණි. මෙම ව්‍යාපෘති 19 හි 2021 දෙසැම්බර් 31 දිනට වැඩ නිම කල ප්‍රතිශතය සියයට 5 සිට සියයට 90 ක පරාසයක් ගෙන තිබුණි. | එකඟ වී ඇත. විවිධ හේතුන් මත ප්‍රමාදවීම් සිදුවී ඇති බවත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් ප්‍රකාශ කර ඇත. | ව්‍යාපෘති ප්‍රමාදවීම හේතු පරීක්ෂා කර ඊට වගකිව යුතු නිළධාරින් සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම සහ නිළධාරින්ගේ කාර්යසාධනය මැනිමේදී මෙම තත්ත්වයක් සැලකිල්ලට ගැනීම ප්‍රමාද ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරිමට කටයුතු කිරිම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 1958 ඔක්තෝම්බර් 07 දින අංක 415 දරන ගිවිසුම මගින් අංක 45, මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි ඉඩමෙන් අක්කර 4 රූඩ්1 පර්චස් 29.8 ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා ටෙනිස් සංගමය වෙත මාසිකව රු.100 ක කුලිය මත වසර 25 කාලයක් බදු දී තිබුණි. 1983 සැප්තැම්බර් 30 දින මෙම බදු ගිවිසුමේ කාලය අවසන් වුවද 2022 අගෝස්තු 31 දින තෙක් විධිමත් බදු ගිවිසුමකට එළඹ | බදු දීමට 2021 ඔක්තෝම්බර් 22 දිනැති මහා සභා තීරණය මගින් අනුමැතිය ලබාදී ඇති අතර ගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත ගොනුව යොමුකර ඇත. | හිඟ බදු අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම සහ විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | නොතිබු අතර නිත්‍යානුකූල ගිිවිසුමකින් තොරව ටෙනිස් සංගමය ඉඩම පරිහරණය කරමින් පැවතුනි. එමෙන්ම උක්ත භූමි ප්‍රමාණයට අමතරව පර්චස් 55 ක වපසරයකින් යුත් ඉඩමක් 1958 වර්ෂයේ සිට කිසිදු කුලි ගෙවීමකින් තොරව ටෙනිස් සංගමය අනවසරයෙන් භාවිතා කරමින් පැවතුනි. 2022 ජුනි 30 දින වන විට ටෙනිස් සංගමය වෙතින් අයකරගත යුතු හිඟ බදු කුලිය රු.30,075,662 ක් විය. | | |
| **(ආ)** | ඉඩම් ලේඛනය අනුව ඉඩම් 168 ක් නගර සභාව සතු වන බව දන්වා ඇතත් එම ඉඩම් වල අයිතිය සභාවට පැවරුණු ආකාරය හෝ නගර සභාවට අයත් ඉඩම් බව සනාථ කර ගැනීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි**.** ඉඩම් 06 තුල අනවසර පදිංචිකරුවන් සිටින බව අනාවරණය කරගෙන තිබු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණී. සභාව සතු උත්සව ශාලා 14 න් 6 ක තොරතුරු පමණක් ඉදිරිපත් කරන ලද ඉඩම් ලේඛනයේ දක්වා තිබු අතර සභාව විසින් බදු දී ඇති ඉඩම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණී. | ඉදිරියේදී සභාවක් ලෙස ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට බලාපොරොත්තු වන අතර බදු දේපල ඉඩම් ලේඛනයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සභා දේපළ පිළිබඳව විධිමත් පසු විපරම් ක්‍රියාවලියක් සකස් කිරිම. |
| **(ඇ)** | හිටපු පුණ්‍ය කොමසාරිස් හට 2017 මැයි 30 දින අංක 1/E මාලිගාකන්දේ පිහිටි පුණ්‍ය කොමසාරිස් නිල නිවස භාරදී තිබුණි. ඒ අනුව 2017 මැයි 30 දින සිට 2020 ජනවාරි 14 දින දක්වා වු කාල සීමාව සඳහා ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව නිවාස කුලි ලෙස නිළධාරියාගේ වැටුපෙන් මාසිකව සියයට 10 ක් බැගින් අයකර ගත යුතු වුවත් මාසිකව රු.3,750 ක් ආර්ථික කුලියක් ලෙස අයකර තිබුණි. ඒ අනුව හිටපු පුණ්‍ය කොමසාරිස්ගෙන් නිවාස කුලි නිවැරදිව ගණනය කර විගණිත දිනය වන විටත් අයකර ගෙන නොතිබුණි. එසේම ඔහු 2020 ජනවාරි 14 දින සිට කොළඹ මහා නගර සභාවෙන් ස්ථාන මාරු වී ගොස් තිබුණද නිල නිවාසයේ සන්තකය 2021 ජනවාරි 12 දින තෙක් භාර නොදීම නිසා ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව එම කාල සීමාව සඳහා අයකළ යුතු දණ්ඩන කුලියද 2021 | එකඟ වේ. | කඩිනමින් හිඟකුලි සහ දණ්ඩන කුලි අයකර ගැනීමට කටයුතු කිරිම. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දින වන විටත් අයකර නොතිබුණි. | | |
| **(ඈ)** | හිටපු නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරික හට නිල නිවස ලබාදුන් දින සිට සභා සේවයෙන් ස්ථාන මාරු වී ගිය දිනය දක්වා වූ කාල සීමාව සඳහා ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව නිවාස කුලී නිළධාරියාගේ වැටුපෙන් මාසිකව සියයට 10 ක් අයකරගත යුතු වුවත් මාසිකව රු.2500 වටිනාකමක් නිවාස කුලී ලෙස අයකර තිබුණි. ඒ අනුව හිටපු නියෝජ්‍ය නාගරික භාණ්ඩාගාරිකගේ නිවාස කුලී නිවැරදිව ගණනය කර හිඟ නිවාස කුලිය 2021 දෙසැම්බර් 31 දිනය වන විටත් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. එමෙන්ම සභා සේවයෙන් ස්ථාන මාරු වී ගිය දින සිට නැවත නිල නිවස භාරදෙන ලද දිනය දක්වා වූ කාල සීමාව සඳහා ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව දණ්ඩන කුලිය නිවැරදිව ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිළධාරිනිය උපලේඛනගත නිවසක පදිංචි වී නොසිට බැවින් වැටුපෙන් සියයට 12.5 සහ දණ්ඩන කුලිය අය කිරීම සඳහා වන සංරක්ෂණ ජෙනරාල් වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. | කඩිනමින් හිඟකුලී සහ දණ්ඩන කුලී අයකර ගැනීමට කටයුතු කිරීම. |
| **(ඉ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 7.2 වගන්තිය ප්‍රකාරව,2012 ජනවාරි 01 සිට 2015 ජනවාරි 14 දක්වා හිටපු නාගරික කොමසාරිස් ස්ථාන මාරු වී ගිය පසුව නිල නිවාසය ආපසු සභාවට භාර නොදීම නිසා දණ්ඩන නිවාස කුලී ලෙස අයකර ගත යුතු රුපියල් දෙමිලියන එකසිය පනස් හතර දහස් හයසිය අසූ එකක (රු.2,154,681) මුදලක් අයකර ගෙන නොතිබුණි. | 1978 පළාත් පාලන නිල නිවාස සන්තකය ආපසු ගැනීමේ විධිවිධාන අනුව නිළධාරිනිය සම්බන්ධව කටයුතු කිරීම ගැටළු සහගතය. ඒ අනුව නිළධාරිනිය දණ්ඩන කුලී අය කිරීමට හැකියාවක් නැත. | කඩිනමින් දණ්ඩන කුලී අයකර ගැනීමට කටයුතු කිරීම. |
| **(ඊ)** | සභාවේ මන්ත්‍රීවරුන්ගේ වාහන සඳහා මුදල් අය කිරීමකින් තොරව ඔවුන්ගේ කාර්යාල ඉදිරිපිට ගාල් කිරීම සඳහා අවසර ලබාදීම සභාවේ පරිචයක් ලෙස පවත්වාගෙන ගොස් තිබූ නමුත් සිදු කළ නියදි පරීක්ෂණය අනුව මන්ත්‍රීවරුන් 51 දෙනෙකු තම වාහන ගාල් කිරීම සඳහා වෙන්කරගත් ස්ථාන වල වෙනත් පුද්ගලයන් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. එමෙන්ම ලිපිගොනු පරීක්ෂාවේදී මන්ත්‍රීවරුන් අදාල ස්ථාන වල තම කාර්යාල පවත්වාගෙන | ඉදිරියේදී මේ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට බලාපොරොත්තු වේ. | විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් ක්‍රියාත්මක කිරීම. |

යන බව තහවුරු කර ගැනීම සඳහා එම ලිපිනයන්හි සඳහන් හිමිකරුවන් සමඟ ඇති කර ගත් බදු ගිවිසුම් දිවුරුම් ප්‍රකාශ හෝ වෙනයම් ආකාරයක නෛතික ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

**3.4 වත්කම් කළමනාකරණය**

--------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018,2019,2020 හා 2021 යන වර්ෂ වල නගරාධිපති නිල නිවස සඳහා මිලදී ගෙන තිබුණු රු.7,934,518 ක් වටිනා උපකරණ අයිතමඅතරින් තෝරාගත් නියැදියක් 2021 දෙසැම්බර් 30 දින භෞතිකව පරීක්ෂා කරන ලදී. නමුත් විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබීම නිසා තෝරා ගත් නියැදිය සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂාවක් සිදු කිරීමට නොහැකි විය. එමෙන්ම විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොගැනීම හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත් ලෙස සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයකට ඇතුලත් කිරිමට කටයුතු කරන බව දන්වා ඇත. | යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීම. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර කොළඹ මහා නගර සභාව වෙත වර්ෂ 2013 සහ වර්ෂ 2019 කාල පරාසය තුල භාරදී ඇති ව්‍යාපෘති 18 ක් විධිමත්ව භාරගත් බවට වු ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර මේ අනුව ව්‍යාපෘති මඟින් ගොඩනගන ලද වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස හඳුනාගෙන තිබේද නැද්ද යන්න තහවුරු කර ගත නොහැකි විය. | ඉදිරියේදී මෙම වත්කම් 18 ප්‍රත්‍යාගණනය කර වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරිමට පියවර ගනී. | වත්කම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරිමට කටයුතු කිරිම. |
| (ඇ) | මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ වැඩ නිම කරන ලද පොම්ප මධ්‍යස්ථාන 04 ක් කොළඹ මහා නගර සභාව වෙත භාරදී තිබු නමුත් එම පොම්ප මධ්‍යස්ථාන 04 හි පවතින යන්ත්‍ර සහ උපකරණ වර්ගීකරණය කර එක් එක් පොම්පාගාරයේ මූල්‍ය පිරිවැය සමඟ ලිඛිතව 2022 මාර්තු 31 දිනය වන විටත් භාරදී නොතිබුණි. | නිමකළ පොම්පාගාර සඳහා දරා ඇති පිරිවැය ඉදිරියේදී හඳුනාගෙන වාර්තා කිරිමට කටයුතු කරමි. | වත්කම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරිමට කටයුතු කිරිම |
| (ඈ) | සභාවට අයත් ස්නෝකල් රථය 2018 අප්‍රේල් 27 දින සිදු වු අනතුර සම්බන්ධව මු.රෙ 104(3) ප්‍රකාර පූර්ණ වාර්තාවක් | පිළිගෙන ඇත | වගකිව යුත්තන් නිශ්වය කර සභාවට සිදු වී ඇති පාඩුව |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබුණේ මාස 30 පමණ පසු 2020 ඔක්තෝම්බර් 12 දිනය. රක්ෂණ හිමිකම ලබා ගැනීම සඳහා හිමිකම් පොරමය අනතුර සිදුවී දින 14 ක් ඇතුලත රක්ෂණ ආයතනයට වෙත භාරදීය යුතු වුවත් අනතුර සිදු වී දින 600 පමණ කාල ප්‍රමාදයකින් පසු හිමිකම් පොරමය භාරදී තිබීම නිසා රක්ෂණ ආයතනය එකඟ වී තිබු රක්ෂණ ආවරණයෙන් රු.596,849 ක් අඩුවෙන් ගෙවීම් කර තිබුණි. | | අයකර ගැනීමට කඩිනමින් කටයුතු කිරිම. |
| (ඉ) | මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ රු.3,159,879 ක් වටිනා මුල්‍ය හා කළමනාරණය ගිණුම්කරණ පද්ධතිය කොළඹ මහා නගර සභාවේ මලාපවහන අවශ්‍ය වෙත 2014 වර්ෂයේදී භාරදී තිබු නමුත් 2016 වර්ෂයේ සිට එම පද්ධතිය භාවිතයට ගෙන නොමැති බව නිරික්ෂණය විය. | පුහුණු නිළධාරීන් නොමැතිකමින් ක්‍රියාත්මක නොවන අතර උපදේශන සේවාවක් මඟින් යාවත්කාලින කිරිමට කටයුතු යොදා ඇත. | වගකිව යුත්තන් හඳුනාගෙන විනය ක්‍රියාමාර්ග ගැනීම සහ කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කිරිම. |
| (ඊ) | සභාවේ අංක නා.හා/ගබඩා ගිණුම්/01/2021 දරන 2021 නොවැම්බර් 23 දිනැති චක්‍රලේඛයේ 5.7 වගන්තිය ප්‍රකාරව සමීක්ෂණය අවසන් කළ පසු එම වාර්තා පරික්ෂා කර බලා ඌනතාවයක් තිබේ නම් එම භාණ්ඩවල වටිනාකම අදාල නිළධාරින්ගෙන් අයකර ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු අතර එසේ ගත් ක්‍රියාමාර්ග 2022 පෙබරවාරි 25 දිනට පෙර නාගරික භාණ්ඩාගාරික වෙත වාර්තා කළ යුතු බව සඳහන් කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඌනතා සම්බන්ධයෙන් ගෙන තිබු ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිරියේදී මෙම කටයුතු අවසන් කිරිමට සටහන් කරගත් බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරිම. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 පෙබරවාරි 17 දින සිදු කර තිබු මිල ගණන් කැඳවීම අනුව රු.61,375,369 ක අවම මිල ඉදිරිපත් කර තිබු කොන්ත්‍රාත්කරුට මුතුවැල්ල ක්‍රීඩාංගනය වැඩිදියුණු කිරිම සහ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව ප්රදානය කර තිබු අතර 2018 ජුනි 18 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. අවස්ථා 05 දී අමතර දින 667 ක දින | මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව බේරුම්කරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක බව දන්වා ඇත. | බේරුම්කරණ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කර කොන්ත්‍රාත්තුව අවසන් කිරිමට කටයුතු කිරිම. |

දීර්ඝ කිරීම් ලබාදී තිබු අතර ඒ අනුව 2019 ජූලි 27 දින අවසන් විය යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුට බදු සහිතව රු.30,143,490 ක් ගෙවීම් කර තිබු අතර මෙය මුළු කොන්ත්‍රාත් පිරිවැයෙන් සියයට 42 පමන විය.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

### 4.1 අතුරු ව්‍යවස්ථා

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපීය ආයෝජන බැංකුව සහ ශ්‍රී ලංකා රජය මඟින් මුල්‍ය සහය ලබාදෙනු ලබන රු.මිලියන 30,229.47 ක් වූ ණය ව්‍යාපෘති 3 යටතේ පවතින මලාපවහන පද්ධතිය පුනුරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීමත්, මලාපවහන පහසුකම් නොමැති ප්‍රදේශවලට සේවාව ව්‍යාප්ත කිරීමත් අරමුණු කරගෙන 2010 වර්ෂයේ සිට අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවති. 2022 ජනවාරි 01 දින වන විට වැඩ අවසන් වූ අපජල පොම්පාගාර 3 ක් කොළඹ මහා නගර සභාව වෙත පවරා තිබුණි. මෙම මලාපවහන පද්ධතිය ආරක්ෂාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා ගාස්තු තීරණය කර අරමුදලක් ගොඩනැගීම, පද්ධතියේ මෙහෙයුම් කටයුතු සිදු කිරිම, පාරසරික හා සමාජීය ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා 2017 වර්ෂයේදී කෙටුම්පත් කරන ලද මලපවහන ගාස්තු ක්‍රමයට අදාල අතුරු ව්‍යවස්ථාව 2021 දෙසැම්බර් 31 දින වන විටත් බලාත්මක කර ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරිමට හැකි වී නොතිබුණි. | 2019 වර්ෂයේදී බස්නාහිර පළාත් සභාව විසුරුවා ඇති බැවින් අනුමත කර ගැනීමට නොහැකි වී ඇත.නව කෙටුම්පතත් ලෙස මහා සභාවේ අනුමත කර 2022 වර්ෂයේදී ආණ්ඩුකාරවරයා වෙත යොමුකර ඇත. අතුරු ව්‍යවස්ථාව සම්මත වූ පසු ගාස්තු අයකර ගන්නා බව දන්වා ඇත. | අතුරු ව්‍යවස්ථාව කඩිනමින් අනුමත කර ගැනීම සහ මලාපවහන ගාස්තු ක්‍රමයක් කඩිනමින් ක්‍රියාත්මක කිරිම. |

### 4.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොළම මහා නගර සභාව වරිපනම් කොට්ඨාශ 47 හි පිහිටුවා ඇති දිසා කාර්යාල 06 ක් මඟින් සභාව හා පුද්ගලික සමාගම් සමඟ එකතුව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කරනු ලබයි. මේ සඳහා 2021 වර්ෂයේ දී රු.2,982 388,253 ක වියදමක් දරා තිබුණි. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වියදම සභාවේ 2021 වර්ෂයේ ශුද්ධ පුනරාවර්තන ආදායමෙන් සියයට 38 ක බව නිරීක්ෂණය වු අතර මහා නගර සභා ආඥා පනතේ 130 වගන්තිය ප්‍රකාරව මහා නගරය තුළ එකතු කරනු ලබන කසළ සභාවේ දේපලක් බවට පත් කර ගැනීමට කටයුතු නොකිරීමෙන් මෙම වියදම සභාවට වැය බරක් පමණක් වී තිබුණු බව නිරීක්ෂණය විය. | දැනට එක්රැස්වන කසල කෙරවලපිටිය waste to energy ව්‍යාපෘතිය වෙත නොමිලේ බැහැර කිරිම මඟින් විශාල මුදලක් ඉතිරි කරගනු ලබයි. | සභාවේ එකතුවන කසල දේපළක් බවට පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

## 4.3 අයවැය පාලනය

--------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු 4 සඳහා ඉදිරිපත් කර තිබූ ආදායම් ඇස්තමේන්තු එකතුව රු.657,638,000 වූ අතර එහි සත්‍ය ආදායමේ එකතුව රු.1,099,007,416 විය. ඒ අනුව අයවැයගත ආදායම ඉක්මවා සත්‍ය ආදායම රු.441,369,416 කින් වැඩිවී තිබූ අතර ආදායම් විෂයන්ගේ විචලනය සියයට 7 සිට සියයට 947 ක පරාසයක පැතිරී පැවතුනි. එමෙන්ම ආදායම් ශීර්ෂ 15 කට අදාලව අයවැයගත ආදායම රු.810,268,000 වූ අතර එහි සත්‍ය ආදායම රු.1,858,571,451 ක් විය. සත්‍ය ආදායම රු.1,048,303,451 කින් වැඩිවී තිබූ අතර ප්‍රතිශතයක් ලෙස සියයට 5 සිට සියයට 443,790 ක පරාසයක විචලනය වී තිබුණි. දෙපාර්තමේන්තු 15 සඳහා ඉදිරිපත් කර තිබූ ආදායම් ඇස්තමේන්තු එකතුව රු.14,806,946,000 ක් වූ අතර එහි සත්‍ය ආදායම රු.10,457,122,919 ක් විය.ඒ අනුව අයවැයගත හා සත්‍ය ආදායම අතර වෙනස රු.4,349,823,081 ක් වූ අතර ප්‍රතිශතයක් ලෙස සියයට 7 සිට සියයට 100 දක්වා පරාසයක පැතිර පැවතුනි. | ඉදිරියේදී මෙම තත්ත්වයක් අවම වන ලෙස අයවැය ලේඛන පිළියෙල කිරීමට පියවර ගෙන ඇති බව දන්වා ඇත. | තාත්ත්වික ලෙස අයවැය ලේඛන පිළියෙල කිරීමට කටයුතු කිරීම. |
| (ආ) | සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු ආදායම සහ සත්‍ය ආදායම එක් එක් වැඩ සටහන අනුව පරික්ෂා කිරීමේදී වැඩ සටහන් 7 ක ආදායම් ශීර්ෂ 10ට අදාලව ඇස්තමේන්තු ආදායම එකතුව රු.362,501,000 ක් වූ නමුත් 2021 වර්ෂය තුල කිසිදු ආදායමක් උපයා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | ආර්ථික අර්බුදය මත ආධාර මුදල් ලැබී නොමැති බව දන්වා ඇත. | තාත්ත්වික ලෙස අයවැය ලේඛන පිළියෙල කිරීමට කටයුතු කිරීම |

## 4.4 නොවිසඳි ඇති විගණන ඡේද

----------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් අංක 43, බාන්ස් පෙදෙස, කුරුඳුවත්ත පිහිටි පර්චස් 154.43 විශාලත්වයක් ඇති දේපල හිමිකරු විසින් වර්ෂයක් ඇතුලත වරිපනම් නොගෙවීම නිසා මහා නගර සභා ආඥා පනතේ අංක 263 වගන්තිය ප්‍රකාරව 1974 ඔක්තෝබර් 07 දින කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේදී මිලදී ගැනීමේ සහතිකය ලියාපදිංචි කර දේපලේ නීත්‍යානුකූල අයිතිය සභාවට පවරාගෙන ඇතත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ භුක්තිය නගර සභාවට පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | භුක්තිය ලබා ගැනීම සඳහා කොළඹ මහ නගර සභාවේ නීති දෙපාර්තමේන්තුව විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ 63194/5/16 දරණ අංකය යටතේ පවරා ඇති නඩුව 2022 නොවැම්බර් 24 වන දින කැඳවීමට නියමිතව ඇත. | ඉඩමේ භුක්තිය ලබා ගැනීමට කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්ලිෆ්ටන් බාලිකා මහා විද්‍යාලය පිටුපස පිහිටි තාප්පය මත සහ ඊට ආසන්නයේ ඉදිකිරීම් සිදුකර ඇති අනවසර ඉදිකිරීම ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කිරීම |
| (ඇ) | 2016 පෙබරවාරි 28 දින වන විට රු.200,863,837 ක වියදමක් දරා කොළඹ 12 පැරඩයිස් පෙදෙසෙහි පිහිටි ලොන්ඩරි භූමිය තුළ ඉදිකර ඇති පැරඩයිස් නිවාස සංකීර්ණයේ නිවාස 64 ක් නිවාස ලබාදීමට නියමිත පදිංචිකරුවන්ට හා අඩු ආදායම්ලාභී නිවාස නොමැති ජනතාවට ලබාදීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු ක්‍රියාත්මක කරන බව දන්වා ඇත. | විධිමත්ව නිවාස බෙදාදීමට කටයුතු කිරීම |
| (ඈ) | සභාවට අයත් මෝදර Elie House ඉඩමෙන් පර්චස් 50 ක් 1992 ජුලි මස ආයතනයකට බදු දී තිබූ අතර එම ඉඩමෙහි ඉතිරි පර්චස් 60 ක ප්‍රමාණයද අනවසරයෙන් එම ආයතනය විසින් තම කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය. එහි අනවසර ඉදිකිරීම් කර ඇති බව අනාවරණය වී ඇතත් එම අනවසර පරිහරණයන් සහ අනවසර ඉදිකිරීම් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | හිඟකුලී අයකර ගැනීමට කටයුතු කිරීම සහ කඩිනමින් නීති ක්‍රියාමාර්ග ගැනීම |
| (ඉ) | කොළඹ මහා නගර සභාව සතු කොළඹ 08 ඇල්විටිගල මාවතේ බොරැල්ල සුසාන භූමි පාලකගේ නිල නිවස පිහිටි භූමියේ අංක 2 දරන ඉඩම් කට්ටි සැලසුමෙහි කැබලි අංක 48 තුල පිහිටි පර්චස් 11 පමණ භූමියේ වර්ග අඩි 6000 ක මහල් දෙකක් අනවසර ලෙස ඉදිකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉවත් කර නොතිබුණි. | නීති ක්‍රියාමාර්ග ගෙන ඇත. | අදාල දේපළ සභාවට පවරා ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඊ) | අංක වස්මැගසින් පාර බොරැල්ල පිහිටි පර් 20 දින සිට 13 සැප්තැම්බර් 1983 ක ඉඩම 17.7 දින 31 දෙසැම්බර් 2020 වර්ෂයකට බදු දුන්නද 2021 .තෙක් ගිවිසුම අළුත් කර නොතිබුණි දෙසැම්බර් 1,025,871.දිනට අයවිය යුතු රු 31 ක හිඟ බදු මුදල 2021දෙසැම්බර් දින 31 .තෙක් අයකර ගෙන නොතිබුණි | සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී | හිඟ මුදල් අයකර ගැනීම සහ බදු ගිවිසුම යාවත්කාලීන කිරීම. |
| (උ) | කොළඹ මහා නගර සභාව සතු තනි නිවාස 12 ක් පුද්ගලයින්ට පවරා තිබූ අතර මෙම නිවාස වලින් 11 ක කුලී වටිනාකම වර්ෂ ගණනාවකින් තක්සේරු කර නොතිබුණි. මෙම නිවාස පිහිටි ස්ථානය, භුක්තිය දරන්නේ කවුද, | සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී | හිඟ මුදල් අයකර ගැනීම සහ බදු ගිවිසුම යාවත්කාලීන කිරීම. |

| | | | |
|---|---|---|---|
| | නිවාසවල වර්ග ප්‍රමාණය සහ නිවාස වල පැවැත්ම පිළිබඳ තොරතුරු නගර සභාව සතුව නොතිබුණි. | | |
| (ඍ) | ගොඩනැගිලි සැලසුම් අංක ME/PBC/BA/01/18 යටතේ අංක 32 මුදලිගේ මාවත කොළඹ 01 පරිශ්‍රයේ ඉදිකර ඇති තට්ටු 7 කින් යුත් වර්ග මීටර් 2143.75 ක්වූ ගොඩනැගිල්ල (B+G+6) හා පරිශ්‍රය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.<br>• අනුමත සැලසුමේ පෙන්වා ඇති හිස් අවකාශය ආවරණය වන පරිදි මහල් 05කින් යුත් වර්ග මීටර් 533.46 කින් යුත් අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.<br>• අනුමත සැලසුම් පරිදි බිම් මහල පොළව මට්ටමේ පැවතිය යුතු වුවත්, ගොඩනැගිල්ලේ බිම් මහල පොලව මට්ටමට වඩා මිලි මීටර් 380 ක් උඩින් ඉදිකර තිබුණි.<br>• අනුමත සැලැසුම පරිදි මුදලිගේ මාවතේ කෙලවරේ සිට අඩි 12 ක ඡන්න පථයක් (Arcade Line) සලකුණු කර ඇතත් එම ප්‍රමාණය ආවරණය වන පරිදි වර්ග මීටර් 40.61 ක අනවසර ඉදිකිරීමක් සිදුකර ඇත.<br>• අනුමත සැලැස්ම පරිදි වාහන 4 ක් ගාල් කිරීම සඳහා බේස්මන්ට් තුළ පහසුකම් සලසා දිය යුතු වුවත් වාහන ගාල් කිරීමේ කොටස ගබඩාවක් ලෙස භාවිතා කරමින් පැවතුණි. | නීති ක්‍රියාමාර්ග ගෙන ඇත. | නීති විරෝධි ඉදිකිරීම් කිරීමට හෝ නිවැරදි කරවීමට කටයුතු කළ යුතුය. |
| (එ) | නගරයේ ඇති අවුරුදු 100 කට වඩා පැරණි ගස්වල කඳ හා මුල්වල තත්ත්වය මැනීමට හා පරීක්ෂා කිරීමට 2015 වර්ෂයේදී රු.මිලියන 7.4 ක් වැය කර ඉඩම් හා පරිසර සංවර්ධන අංශය විසින් මිලදී ගෙන තිබු ගසේ ව්‍යුහය පරීක්ෂා කිරීමේ යන්ත්‍රය 2020 දෙසැම්බර් 31 දින වන විටත් අවු.6 ක් ගත වී ඇතත් භාවිතයෙන් තොරව විහාරමහාදේවි උද්‍යාන කාර්යාලයෙහි තබා තිබුණි. | යන්ත්‍රය මගින් ලබාදෙන දත්ත විශ්ලේෂණය කල හැකි නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම සහ දත්ත විශ්ලේෂණය සඳහා යන්ත්‍රය මිලදී ගත් ආයතනය හා සාකච්ඡා පැවැත්වීම. | කඩිනමින් භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. |
| (ඒ) | මල්වත්ත පාර පදික වෙළඳ සංකීර්ණය සඳහා එකක් රු.29,325 ක් බැගින් බක්කි 200 ක් රු.5,865,000 කට 2016 සැප්තැම්බර් මස මිලදීගෙන තිබු අතර 2021 දෙසැම්බර් 31 දින | බක්කි ලබා ගැනීම වෙළඳුන් විසින් ප්‍රතික්ෂේප කල බැවින් ඵලදායි කාර්යයට යොදා ගත නොහැකි වුවත් එම කඩ බක්කි | කඩිනමින් ඵලදායි කාර්යයන් සඳහා යොදාග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | වන විටත් මෙම බක්කි කඩ ඵලදායි කාර්යයට යොදවා නොමැතිව ස්වාභාවික ආපදාවන්ට ගොදුරු වෙමින් අනාරක්ෂිතව නිශ්ප්‍රයෝජන තත්ත්වයට පත්වෙමින් පැවතුණි. | වෙනත් පොදු වෙළඳපොළ අවශ්‍යතා මත යොදා ගැනීම සඳහා යෝජනා කර ඇත. | |
| **(ඔ)** | 2018 මාර්තු 16 දින රු.4,242,600 වටිනාකමට මිලදී ගෙන තිබූ සතුටු උයන සඳහා භාවිතා කරන කැන්ගරු රයිඩර් යන්ත්‍රය මිලදී ගෙන මාස 2 ඇතුලත කැඩියාම නිසා 2018 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර ඇත. මෙම පාඩුව පියවා ගැනීම සඳහා සැපයුම්කාර ආයතන විසින් ඉදිරිපත් කර තිබූ රු.2,723,735 ක කාර්යසාධන ඇප බැඳුම්කරය සභාවට පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර එමගින් ආවරණය නොවූ රු.2,154,564 මූල්‍ය අලාභය 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | කඩිනමින් අයකර ගැනීමේ කටයුතු කිරිම |
| **(ඕ)** | නාගරික ලේකම් දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2017 සැප්තැම්බර් 04 දින අනතුරට පත්වීම නිසා සභාවට සිදුවූ රු.131,462 ක අලාභය ඊට වගකිව යුතු හිටපු නාගරික ලේකම්ගෙන් අයකර ගැනීමට 2021 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මුදල් අයකර ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකසා දෙන ලෙස පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත 2021 දෙසැම්බර් 24 දන්වා ඇතත් ක්‍රියාමාර්ග ගෙන නොමැත. | කඩිනමින් සභාවට සිදුවූ පාඩුව පියවා ගැනීමට ක්‍රියා කිරිම. |
| **(ඖ)** | සභා බල ප්‍රදේශයක පාර්කින් මීටර් සවිකර රථ වාහන ගාල් කර කුලි අයකර ගැනීම සම්බන්ධව පුද්ගලික සමාගමක් සමඟ 2016 මාර්තු 28 දින අංක 53/2016 ගිවිසුම මඟින් ගිවිසුම්ගත වී තිබුණි. නමුත් අදාල සමාගම ගිවිසුම් ප්‍රකාරව කුලි මුදල් නොගෙවීමත් සභාවේ වගකිව යුතු නිළධාරීන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරිමත් නිසා අයකර ගත යුතු හිඟ කුලි වටිනාකම වූ රු.101,161,649 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | නීති ක්‍රියාමාර්ග ගෙන ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කිරිම. |